සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

45 | S | I

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016
## Third Term Test - Grade 13 - 2016

විභාග අංකය .............................. **බෞද්ධ ශිෂ්ටාචාරය I** කාලය පැය දෙකයි

**වැදගත්,**
- සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1,) (2),(3),(4),(5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුරු තෝරා ගෙන එය පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදන්න.

1. බ්‍රාහ්මණ වර්ණය තම සමාජ ප්‍රභුත්වය දිගින් දිගටම භාරතීය සමාජය තුළ පවත්වා ගැනීම සඳහා ආගම මුල් කර ගත් ඉගැන්වීම් රැසක් ඉදිරිපත් කළහ. ආශ්‍රම ධර්ම යනු එයින් එක් ඉගැන්වීමකි. ආශ්‍රම ධර්ම වශයෙන් ව්‍යවහාර වන්නේ,
   1. පූජක බමුණන් විසින් ආශ්‍රමයක් තුළ රැඳී සිටිමින් කරන ලද ආගමික කාර්ය භාරයයි.
   2. කිසියම් වර්ණයකට අයත් අයෙකු ආපදාවකට ලක් වූ පසුව අනුගමනය කළ යුතු කාර්ය භාරයයි.
   3. දිවිහිමියෙන් බමුණන් විසින් මහා බ්‍රහ්මයාට ප්‍රතිඥා දී අනුගමනය කිරීමට බැඳී ඇති කාර්ය භාරයයි.
   4. පුද්ගල ජීවිතයක් අවධිවලට බෙදා එක් එක් අවධිවලදී කළ යුතු කාර්ය භාරයයි.
   5. පැරණි වයඹ දිග ඉන්දියාවේ විසූ ඍෂිවරුන් විසින් ආධ්‍යාත්මික විමුක්තිය උදෙසා සිදු කළ කාර්ය භාරයයි.

02. චතුර් වර්ණයට අයත් ස්වධර්ම පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ අන්‍ය වර්ණයන්ට කළ නො හැකි බ්‍රාහ්මණ වර්ණයට පමණක් ම නිර්දේශිත වූ ක්‍රියාකාරකම් පැවති බවයි. එසේ බ්‍රාහ්මණ වර්ණයට පමණක් පොදු වූ ක්‍රියාකාරකම් දෙකක් වනුයේ ,
   1. දන්දීම හා යාග කිරීමයි.
   2. වේද අධ්‍යයනය හා දන් පිළිගැනීමයි.
   3. වේද අධ්‍යයනය හා දන් දීමයි.
   4. වේදය හැදෑරීම හා යාග කිරීමයි.
   5. වේදය ඉගැන්වීම හා යාග කිරීමයි.

03. බමුණන් විසින් නිර්දේශිත මහා යාගයන් සිදු කිරීම සඳහා බ්‍රාහ්මණ පූජකවරුන් කිහිප දෙනෙකුගේ සහභාගිත්වය අත්‍යවශ්‍ය වූ අතර ඔවුනට එහිදී වෙන් වූ කාර්ය භාරයන් ද පැවතුණි. ඒ අනුව උද්ඝාතෘට පැවරුණු කාර්යය වනුයේ,
   1. යාගයට ආරාධනා කිරීමයි.
   2. යාගයේ අධ්‍යක්ෂ ක්‍රියාවලියයි.
   3. වේද පාඨ ගායනා කිරීමයි.
   4. යාගය සිදු කිරීමයි.
   5. යාග භූමිය සකස් කිරීමයි.

04. පූර්ව වෛදික යුගය තුළදී භාරතීය වනිතාව පූජනීයත්වයක් ලබා සිටි බවට තොරතුරු මොහෙන්ජදාරෝ හරප්පා ශිෂ්ටාචාරය ආශ්‍රිතව කළ කැණීම්වලින් හෙළි කර ගෙන ඇත. ඒ සඳහා ලබා දිය හැකි වැදගත් සාක්ෂියක් වනුයේ,

1. මාල හා අතපුරා වළලු පැලඳ සිටි කාන්තා රූප හමුවීම ය.
2. ලොකු කුඩා සැම නිවසකම ජගත් මාතා පිදීම පැවතීම ය.
3. කන්‍යාභාවය ප්‍රකට කෙරෙන මානවිකාවන්ගේ මුද්‍රා හමුවීම ය.
4. යෝනියකින් ලතාවක් පැන නගින ආකාරයේ මුද්‍රාවක් හමුවීම ය.
5. ශිව දේව වන්දනය පැවතීම ය.

05. බුදුරජාණන් වහන්සේ පිරිමි පාර්ශවයට මෙන් ම කාන්තා පාර්ශවයට ද සමාන අයිතිවාසිකම් ලබා දීමට ක්‍රියාකර ඇත. ගැහැනු පිරිමි භේදයකින් තොර ව ශාසනික ප්‍රතිලාභ උරුම කරදීම තුළින් ඒ බව පැහැදිළි වේ. භික්ෂුණී හා උපාසිකා පිරිස් සඳහා ද තනතුරු ප්‍රදානය කර ඇත. ඒ අනුව සෘද්ධිමත් භික්ෂුණීන් අතර අග්‍රස්ථානය හා මෛත්‍රී විහාර ඇති උපාසිකාවන් අතර අග්‍රස්ථානය හිමි වූයේ,

1. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියට හා විශාඛා උපාසිකාවට ය.
2. උප්පලවන්ණා තෙරණියට හා සාමාවතී උපාසිකාවට ය.
3. ඛේමා තෙරණියට හා ඛුජ්ජුත්තරා උපාසිකාවට ය.
4. පටාචාරා තෙරණියට හා සුජාතා උපාසිකාවට ය.
5. සකුලා තෙරණියට හා සුප්පාවාස උපාසිකාවට ය.

06. තියුණු සැතකින් යමෙක් යමෙකුගේ හිස සිඳින්නේ නම් එයින් කිසිවෙකුත් විසින් ඝාතනය නොකරන ලද බවත් හුදෙක් සප්තකාය සැත (ආයුධය) විවරයට වැද ගැනීම පමණක් සිදු වන බවත් උගන්වමින් කුසලා කුසල විපාක නොපිළිගත් ශාස්තෘවරයා වූයේ,

1. පූර්ණ කාශ්‍යප ය. 2. මක්ඛලී ගෝසාල ය. 3. අජිත කේශකම්බලී ය.
4. පකුධ කච්චායන ය. 5. සංජය බෙල්ලට්ඨි පුත්ත ය.

07. ජෛන මහාවීර හෙවත් නිඝන්ඨනාථපුත්ත ශාස්තෘවරයාගේ ඉගැන්වීම් තුළ දර්ශනවාද කිහිපයක් දක්නට ලැබේ. චතුයාම සංවරවාදය, පුබ්බේකත හේතුවාදය, පරම අවිහිංසාවාදය, කාය දණ්ඩවාදය, යනුවෙන් දැක්වෙන්නේ එයින් කිහිපයකි. මොහුගේ ඉගැන්වීම්වලට ඇතුළත් විය යුතු අනෙක් දර්ශන වාදය වන්නේ,

1. ආත්ම වාදයයි. 2. අනාත්ම වාදයයි. 3. නියති වාදයයි.
4. සුඛ පරම වාදයයි. 5. අහේතු අපච්චයතා වාදයයි.

08. ශාක්‍යපුත්‍ර ශ්‍රමණ යන ආගමික පිරිස ද පොදුවේ ගත් කළ ශ්‍රමණ ආගමික සංස්ථාව නියෝජනය කළ පිරිසකි. නමුත් ශාක්‍ය පුත්‍ර ශ්‍රමණ පිරිස් සෙසු ශ්‍රමණ පිරිස්වලින් වෙනස් වන ලක්ෂණ ගණනාවක් පැවතුනි. ඒ අතර ඇති ප්‍රමුඛ ලක්ෂණයක් වන්නේ,

1. අන්තගාමී බවින් තොර ව මධ්‍යම ප්‍රතිපාදාවෙන් යුක්ත වීමයි. 2. සංචාරක ජීවිතයක් ගත කිරීමයි.
3. දුෂ්කර ව්‍රත සමාදානයේ නිරතවීමයි. 5. පිණ්ඩපාතයෙන් යැපීමයි.
4. අනගාරික ප්‍රතිපදාවක් අනුගමනය කිරීමයි.

09. මූලික බෞද්ධ ඉගැන්වීම් පරීක්ෂා කිරීමේදී එහි අසහාය දෙවි කෙනෙකුගේ පැවැත්ම හෝ විශ්වය කෙරෙහි අධිකාරීත්වය පැනවීම හෝ නො පිළිගන්නා බැව් තහවුරු වේ. බුදු දහම මානව කේන්ද්‍රීය දහමක් ලෙස හැඳින්වීමට බොහෝ උගතුන් පෙළඹී ඇත්තේ එහි අන්තර්ගත,

1. මානව ශක්‍යතාවයන් අගය කිරීමේ ගුණය නිසා ය.
2. කර්මයෙහි පවත්නා නියතිවාදී ස්වභාවය නිසා ය.
3. අදිච්ච සමුප්පන්නවාදී ලක්ෂණ නිසා ය.
4. භෞතික ලෝකය ඇසුරින් තම ඉගැන්වීම් ඉදිරිපත් කළ නිසා ය.
5. පාර භෞතික ඉගැන්වීම් පිළිබඳ අවධානය යොමු කළ නිසා ය.

10. මහා රාජ්‍යයන්ට අයත් එක් රාජ්‍යයක් මුල් වකවානුවේ දුර්වල රාජ්‍යයක් ලෙස පැවතුණි. ක්‍රමයෙන් එය ප්‍රබල රාජ්‍යයක් බවට පත් වුයේ වීර කාව්‍ය යුගයේ පටන් ය. බුද්ධ කාලය වනවිට එය බලගතු රාජ්‍යයක් බවට පත්වී තිබුණි. එම රාජ්‍ය වන්නේ,

1. මගධ රාජ්‍යයයි. 2. කෝසල රාජ්‍යයයි. 3. වත්ස රාජ්‍යයයි.
4. අවන්ති රාජ්‍යයයි. 5. වජ්ජි රාජ්‍යයයි.

11. බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝරත්නය වෙනුවෙන් ආරාම ඉදිවීම සොළොස් මහා ජනපදයන්ට අයත් බොහෝ රාජ්‍යයන්හි සිදුවිය. කෝසල රාජ්‍යයේ පමණක් ආරාම කිහිපයක් ඉදිවී තිබුණි. ඉන් කිහිපයක් වනුයේ,

1. ජේතවනාරාමය, වේළුවනාරාමය හා පූර්වාරාමයයි.
2. ජේතවනාරාමය,පාවාරිකාරාමය හා රාජකාරාමයයි.
3. පූර්වාරාමය, රාජකාරාමය හා කුක්කුටාරාමයයි.
4. ජේතවනාරාමය,ඝෝෂිතාරාමය හා රාජකාරාමයයි.
5. ජේතවනාරාමය, පූර්වාරාමය හා රාජකාරාමයයි.

12. බුද්ධකාලීන භාරතයේ දේශපාලනය පිළිබඳව විමසීමේ දී රාජාණ්ඩු හා ගණතන්ත්‍ර යනුවෙන් පාලන ක්‍රම දෙකක් පැවතුණි. එම පාලන ක්‍රම දෙකට වෙන් වු විශේෂ ලක්ෂණ ගණනාවක් ද දක්නට ලැබුණි. ගණතන්ත්‍ර පාලනයන්හි පැවති විශේෂ ලක්ෂණයක් වන්නේ,

1. පියාගෙන් වැඩිමහලු පුතාට රජකම හිමිවීමයි.
2. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ත්‍රිවිධ බලතල එක් පුද්ගලයෙක් වෙත කේන්ද්‍රගතව පැවතීමයි.
3. සමූහයක් එක්ව රාජ්‍ය පාලන කටයුතු සිදු කිරිමයි.
4. මත්ස්‍ය න්‍යායට අනුව ක්‍රියා කිරීමයි.
5. යුවරජ, පුරෝහිත, සේනාධිනායක පිරිස් පාලනයට සම්බන්ධ කර ගැනීමයි.

13. බුද්ධකාලීන වාණිජකරණය හේතුවෙන් පහළ වූ නව ධනපති පන්තිය හැඳින්වුයේ ,

1. වෙළෙන්දන් ලෙස ය. 2. වෛශ්‍යයන් ලෙස ය. 3. සිටුවරු ලෙස ය.
4. මහා සෙට්ඨි ලෙස ය. 5. උත්තර සෙට්ඨි ලෙස ය.

14. බමුණන් විසින් දීර්ඝ කාලයක් මුළුල්ලේ පවත්වාගෙන එනු ලැබූ පන්ති සමාජය බුද්ධ කාලය වන විට ක්‍රමයෙන් වෙනසකට භාජනය වෙමින් පැවතුණි. සමාජයේ තුන්වෙනි පන්තිය නියෝජනය කළ වෛශ්‍යයන් බ්‍රාහ්මණ වංශිකයන්ට මෙන් ම ක්ෂත්‍රීය වංශිකයින්ට ද අභියෝගාත්මකව නැගී සිටි බවක් දක්නට ලැබේ. ඔවුන් එසේ ප්‍රබලයින් වීමට බලපෑ හේතුන් අතර ප්‍රමුඛ හේතුව වන්නේ,

1. ප්‍රශස්ත මට්ටමේ අධ්‍යාපනයක් ලබා සිටීමයි.
2. වෙළදාම තුළින් විදේශ සබඳතා ගොඩනගාගෙන සිටීමයි.
3. විශාල කර්මාන්ත පවත්වාගෙන යාමයි.
4. වෙළදාම හා කර්මාන්ත තුළින් විශාල ධනයක් හිමි කරගෙන සිටීමයි.
5. ශ්‍රමණ සම්ප්‍රදායේ අනුග්‍රාහකයින් වශයෙන් කටයුතු කිරීමයි.

15. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් සමාජ සම්භවය පිළිබඳ කතා පුවතට අනුව මෙළොව පහළ වූ ප්‍රථම අසද්ධර්මය ලෙස සැලකිය හැකි වන්නේ,

1. මුසාවාදයයි. 2. සොරකමයි. 3. රාගයයි.
4. මානයයි. 5. තෘෂ්ණාවයි.

16. දිළිඳුකම සමාජ ප්‍රශ්න රැසකට තුඩු දෙන්නක් බව බුදු දහමේ ඉගැන්වීම වේ. එම සමාජ ප්‍රශ්න නිරාකරණය කිරීමේදී පාලකයා විසින් කළ යුතු ප්‍රමුඛතම කාර්යයකි.

1. දඬුවම තදින් ක්‍රියාත්මක කිරීම.
2. වැරදිකරුවන්ට නිවැරදි උපදෙස් ලබාදීම.
3. දිළිඳුකම ඇතිවීමට හේතු සොයා බැලීම.
4. දිළිඳුකම දුරලීමට හේතුවන පරිද්දෙන් ධනෝපායන් මාර්ග වැඩි කිරීම.
5. දිළින්ඳන් නගා සිටුවීම.

17. හේතුඵලවාදී මූලධර්ම මත පිහිටා සමාජ ප්‍රභවය හා විකාශනය සිදුවූ ආකාරය විග්‍රහ කරන බුදු සමය සමාජය ක්‍රමිකව පරිණාමය වූවක් ලෙස සළකයි. මෙම සන්දර්භය තුළ ආර්ථික , දේශපාලනික , ආගමික හා ගෘහස්ථ සමාජ සංස්ථාව ප්‍රභවය වූයේ,

1. පුද්ගලයාගේ අත්තනෝමතික ක්‍රියාකාරකම් පදනම් කරගෙන ය.
2. දේව නිර්මාණයක් වශයෙනි.
3. පුද්ගලයා උපතින් වර්ගීකරණයට ලක්වීම නිසා ය.
4. පුද්ගල ගැටලුවලට විසඳුම් සෙවීම තුළිනි.
5. පුද්ගල ස්වාධීනතාව තහවුරු කර ගැනීමට දැරූ ප්‍රයත්නය තුළිනි.

18. බුදුරදුන් දීඝජාණුකෝලිය පුත්‍රයාට දේශනා කළ ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙහි අන්තර්ගතය උට්ඨාන සම්පදා , ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා යන ඉගැන්වීම් වඩාත් යෝග්‍ය වන්නේ,

1. රාජ්‍ය පාලනයට අදාළ ඉගැන්වීම් වශයෙනි.
2. ආර්ථික සංවර්ධනයට අදාළ ඉගැන්වීම් වශයෙනි.
3. මිත්‍රත්ව සංකල්පය වර්ධනයට අදාළ ඉගැන්වීමක් වශයෙනි.
4. කුසල් අකුසල් විනිශ්චය කිරීමේ මිණුම් දණ්ඩක් වශයෙනි.
5. යථාවබෝධය ලබා ගැනීමට අදාළ බුදු දහමේ දැක්වෙන මූලික ඉගැන්වීමක් වශයෙනි.

19. නිදහස් චින්තනය හා විමංසනය අගය කරන බුද්ධ කාලීන දේශනා අතර කාලාම සූත්‍රය වඩාත් ප්‍රකට ය. සමකාලීන සාමයික පරිසරය තුළ බුදු දහමේ සුවිශේෂත්වය හෙළිකරන දේශනාවක් වන එම සූත්‍රයෙන්

1. පිටක සම්ප්‍රදාය පිළිගැනෙයි.
2. ඉතිහාසය ප්‍රමාණික වශයෙන් පිළිගැනෙයි.
3. තමාගේ අදහසට ගැළපේ නම් පිළිගැනෙයි.
4. සදාචාරය පිළිබඳ පැනවීම් බැහැර කෙරෙයි.
5. නුවණැත්තන්ගේ අදහස් පිළිගැනෙයි.

20. බෞද්ධ ආර්ථික දර්ශනය තුළ දැක්වෙන පරිභෝජන ක්‍රියාවලිය හුදෙක් කේවල වූවක් නො වේ.එය සාමූහිකව සිදුවිය යුත්තකි. ඒ බව සූත්‍ර ගණනාවක තොරතුරු වලින් දැක්වේ. පහත සඳහන් සූත්‍ර අතරින් මෙයට වඩාත් අදාළ වන්නේ,

1. පත්තකම්ම සූත්‍රයයි.
2. කරණීය මෙත්ත සූත්‍රයයි.
3. අණන සූත්‍රයයි.
4. චක්කවත්තී සීහනාද සූත්‍රයයි.
5. අරිය පර්යේෂණ සූත්‍රයයි.

21. වසර දහයක් අඛණ්ඩව කන්දෙගෙදර ස.ණ.ස සමිතියේ සභාපති ධූරය හොබවා එම ධූරයෙන් සමුගත් ධර්මදාස මහතා පිළිබඳ ව අභිනවයෙන් පත්වූ සභාපතිතුමා කළ කතාවෙන් කොටසක් පහත දැක්වේ.

"හිටපු සභාපතිතුමා අපේ සමිතියේ දියුණුවට මහඟු මෙහෙවරක් පසුගිය දශකය තුළ සිදුකළා. සමිතියේ ව්‍යවස්ථාව අකුරටම ක්‍රියාත්මක කළා. නියමිත පරිදි කඩ නො කර සෑම රැස්වීම් වාරයක්ම පැවැත්වූවා. ඒවාට කඩ නො කොට සහභාගි වුනා. සභාව හොඳින් පවත්වාගෙන යාමේදී සමගිය ආරක්ෂා වන පරිදි කටයුතු කළා. එතුමා වැඩිහිටියෙක් වුනත් වැඩිහිටියන්ට ගරුකිරීම ඉහළින්ම සිදුකළා. සමිතියේ සියලු දෙනාම සම්බන්ධ කර ගෙන අවට පූජනීය ස්ථානවල ශ්‍රමදාන පැවැත්වූවා. ඒවායේ සංවර්ධනයට අදාළ බොහෝ දේ කළා. ඒවා මෙවන් අවස්ථාවක සිහිපත් කිරීම කළගුණ දන්නා පිරිසක් වශයෙන් අපේ යුතුකමක්." ඔහුගේ එම කතාව තුළ එක්තරා පාලන මූලධර්මයක අඩංගු කාරණා ගණනාවක් ස්මතු කෙරුණි. එම පාලන මූලධර්මය වන්නේ,

1. දස සක්විතිවත් ය.
2. දසරාජ ධර්ම ය.
3. සප්ත අපරිහානීය ධර්ම ය.
4. පඤ්චසීල ප්‍රතිපදාව ය.
5. සතර සංග්‍රහ වස්තු ය.

22. ස්වභාව සෞන්දර්ය හා නිර්මාණාත්මක සෞන්දර්ය බුදුරදුන්ගේ මෙන් ම ශ්‍රාවකයින්ගේද ඇගයීමට ලක්වූ අවස්ථා ත්‍රිපිටක සාහිත්‍යයේ සුලභව දැකිය හැකි ය. එහෙත් "නච්ච ගීත වාදිත විසූක දස්සන " යන ශික්ෂාපදයෙන් සරාගී සෞන්දර්ය රසාස්වාදය තහනම් කොට තිබේ. එය අදාළ වන්නේ

1. සියලු ම බෞද්ධයින්ට ය.
2. උපාසක උපාසිකාවන්ට ය.
3. පෙහෙවස් සමාදන් වූවන්ට ය.
4. කුමර බ්‍රහ්ම චර්යාවේ හැසිරෙන අයට ය
5. සිව්වනක් පිරිසට ය.

23. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසා සමාජයේදී එකිනෙකාගෙන් ඉටුවිය යුතු යුතුකම් 61 පිළිබඳව දැක්වේ. එම යුතුකම් අතර දක්ෂ හා අනලස්ව කටයුතු කිරීම කවුරුන් විසින් කා හට කළ යුත්තක් ද?

1. ස්වාමිපුරුෂයාගෙන් භාර්යාවට
2. භාර්යාවගෙන් ස්වාමිපුරුෂයාට
3. සේවකයාගෙන් ස්වාමියාට
4. දරුවන්ගෙන් දෙමව්පියන්ට
5. ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට

24. ශ්‍රද්ධාව අමූලික හා ආකාරවතී යනුවෙන් කොටස් දෙකකට බෙදෙන අතර මේ අංශ දෙකට අනන්‍ය වූ ලක්ෂණ ද දක්නට ලැබේ. ඒ අනුව ආකාරවතී ශ්‍රද්ධාවෙන් යුක්ත පුද්ගලයකුගේ චරිත ලක්ෂණයකි.

1. ත්‍රිවිධ රත්නය කෙරෙහි අපරිමිත භක්තියෙන් කටයුතු කිරීම.
2. ආමිස දානමය පුණ්‍යකර්මය පිළිබඳ වැඩි විශ්වාසයක් ඇතිකර ගැනීම.
3. කිසි විටකත් තුණුරුවන් පිළිබඳව අපහැදීමක් ඇති කර නොගැනීම.
4. බුද්ධ ප්‍රතිමාවක් දුටුවිට හුනස්නෙන් නැගිට ආචාර කිරීම.
5. බෝධි පූජා පවත්වා දෙවියන්ගෙන් පිහිට පැතීම.

25. සම්පත් කළමනාකරණය මෙන්ම සංරක්ෂණය පිළිබඳවත් වැදගත් උපදේශයක් අංගුත්තර නිකායේ කුල සූත්‍රයේ දැක්වේ. එහි සඳහන් කරුණුවලට අමතරව දක්වා ඇත්තේ මෙයින් කුමක් ද?

1. සම්පත් සංරක්ෂණයට කටයුතු කිරීම.
2. නැසුණු සම්පත් ඉපයීම.
3. පරිභෝජනයේ සීමා දැන ගැනීම.
4. දිරායන දේ ප්‍රතිසංස්කරණය කිරීම.
5. නිවසක ආධිපත්‍ය දරන පිරිමියා හෝ ගැහැනිය සිල්වත් වීම.

26. ධර්මදාස මිය ගිය ඥාතිවරයාගේ පරලොව ජීවිතය සුගතිගාමී කිරීමේ අරමුණින් සත් දවසේ පවත්වන ධර්මදේශනාමය පිංකමත්, පසුදින සංඝගත දක්ෂිණාවත් ප්‍රදේශවාසී බොහෝ දෙනා ද සහභාගි කරවාගෙන සිදුකරන ලදී. මෙම උතුම් පිංකම තුළ දස පුණ්‍ය ක්‍රියාවල කුමන අංග ඇතුළත් වේ ද?

1. පත්තිදානය හා පත්තානුමෝදනාව
2. පත්තිදානය හා වෙයියාවච්චය
3. පත්තානුමොදනාව හා ධම්මදේශනාව
4. පත්තිදානය හා අපචායනය
5. පත්තානුමෝදනාව හා දිට්ඨිජ්ජුකම්මය

27. බුදුරදුන් සෞන්දර්ය රසාස්වාදය කිසිවිටකත් බැහැර කොට නැත. ඒ බව තහවුරුකරන විවිධ ප්‍රකාශයන් බුද්ධ චරිතය තුළින් හඳුනාගත හැකිය. ඒ අනුව බුදුරදුන් පරිසර සෞන්දර්ය අගය කළ අවස්ථාවක් වන්නේ

1. විශාලාවේ වජ්ජීන්ගේ රූමත්කම ඇගයීම ය.
2. පඤ්චසිකගේ වීණා වාදනය ඇගයීම ය.
3. උග්ගසේන නම් ක්‍රීඩකයාගේ දක්ෂතා ඇගයීම ය.
4. සප්පක හිමියන් නදිය අසබඩ සුන්දරත්වය ඇගයීම ය.
5. චාපාල, ගෝතමක, සත්තම්බ ආදී ස්ථානවල සුන්දරත්වය ඇගයීම ය.

28. "අත්ථාහි අත්තථනෝනාථෝ කෝහි නාථෝ පරෝසියා" යන පාළි පාඨය වඩාත් අදාළ වන්නේ

1. බුදුරදුන්ගේ තාදී ගුණය විවරණය කිරීමට ය.
2. වර්ණධර්ම විවේචනය කිරිම උදෙසා ය.
3. බුදු දහමේ සිතීමේ සහ විමසීමේ නිදහස තහවුරු කිරීම සඳහා ය.
4. මානව වර්ගයාගේ ඒකත්වය සනාථ කිරීම සඳහා ය.
5. පුද්ගල ස්වාධීනතාවය පිළිබිඹු කිරීම උදෙසා ය.

29. ධර්මසේන ගොවිමහතා උත්සාහවන්තයෙකි. ධාර්මිකව කටයුතු කරන ඔහු සිය ශක්ති ප්‍රමාණයෙන් දරුපවුල පෝෂණය කරයි. සමාජ යුතුකම් නොපිරිහෙලා ඉටුකරයි. තරඟකාරී සමාජයක ජීවත් වුවද තම වුවමනාවන් වැඩිකර ගැනීමට ප්‍රිය නොකළේය. වුවමනාවන් වැඩිකර ගැනීම අවසානයක් නොපෙනෙන කටයුත්තක් ලෙස වටහා ගැනීමට තරම් හැකියාවක් ද ඔහුට තිබුණි. මොහුගේ මෙම ආකල්පය හා ක්‍රියාකාරීත්වය තුළින් හඳුනා ගතහැකි බෞද්ධ චින්තනය වන්නේ,

1. අල්පේච්ඡතාවයි. 2. අල්පකෘත්‍යතාවයි. 3. මහිච්ඡතාවයි.
4. බහුකිච්ඡතාවයි. 5. පාපිච්ඡතාවයි.

30. ධාර්මිකව උපයන ලද ධනය එක්රැස්කර තබා ගැනීමෙන් පමණක් සැප ලැබිය නොහැකිය. එය තමාගේ යහපත සඳහා පමණක් නොව තම අඹුදරුවන් ඤාතිමිත්‍රාදීන් මෙන්ම සමාජ යුතුකම් ඉටුකිරීමට ද ධනය කැප කළ යුතුය. එසේම පින් දහම් කිරීමටද ධනය කැපකළ යුතුය. මෙසේ ධනය පරිහරණය කිරීමෙන් ලැබෙන සැපය,

1. සාමිස සුඛ නම් වේ. 2. අත්ථි සුඛ නම් වේ. 3. භෝග සුඛ නම් වේ.
4. අණන සුඛ නම් වේ. 5. අණවජ්ජ සුඛ නම් වේ.

31. බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රශ්න විසඳූ ක්‍රම හතරක් පිළිබඳව පෙළ දහමේ සඳහන් වේ. ඒකාංශ ව්‍යාකරණීය, විභජ්ජ ව්‍යාකරණීය, පටිපුච්ඡා ව්‍යාකරණීය, ඨපනීය යනුවෙන් දැක්වෙන්නේ එම හතරයි. මෙහි සඳහන් ඒකාංශ ව්‍යාකරණීය යනුවෙන් අදහස් කෙරෙන්නේ

1. පිළිතුර ලබා නොදුන් ප්‍රශ්නයි.
2. අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු ලබාදුන් ආකාරයයි.
3. ප්‍රතිප්‍රශ්න විමසා පිළිතුරු ලබාදීමයි.
4. කොටස්වලට බෙදා විග්‍රහකොට පිළිතුරු ලබාදීමයි.
5. ඇසූ ප්‍රශ්නයට එක එල්ලේම ඍජු පිළිතුරු ලබාදීමයි.

32. "භවත්නි මහණ ගොයම්භූ තුමා වූ කලී මව් පසින් ද පිය පසින් ද යන දෙපසින් අභිජාත ය. උන්වහන්සේ රූප සම්පත් ඇත්තෝ ය. දැකුම් කටයුත්තා හ. ප්‍රසාද ජනක ය. උතුම් සෞන්දර්යෙන් සමන්විත ය. උත්තම ශරීර ප්‍රභාව ඇත්තෝ ය." බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය මෙසේ ගෙනහැර දැක්වූයේ,

1. ජානුස්සෝනි බමුණා ය. 2. අස්සලායන බමුණා ය. 3. සෝණදණ්ඩ බමුණා ය.
4. ද්‍රෝණ බමුණා ය. 5. වාසෙට්ඨ බමුණා ය.

33. භික්ෂු භික්ෂුණී දෙපිරිසගේම ජ්‍යේෂ්ඨත්වය මැනෙන්නේ උපසම්පදාවෙනි. සමන්තපාසාදිකා අටුවාව අනුව බුද්ධකාලීනව ආරම්භ වූ උපසම්පදා ක්‍රම අටක් පිළිබඳව තොරතුරු දක්වේ. බුදුරදුන් පළමු වතාවට දූතේන උපසම්පදාව නිර්දේශ කරනු ලැබුවේ,

1. සෝපාක හිමියන් අරඹයා ය.
2. අඩ්ඪකාසී තෙරණිය අරඹයා ය.
3. අම්බපාලී තෙරණිය අරඹයාය.
4. සෝමා තෙරණිය අරඹයා ය.
5. ප්‍රජාපතිගෝතමී තෙරණිය අරඹයා ය.

34. බෞද්ධ භික්ෂු සංස්ථාව ආරම්භ වූ මුල්වකවානුවේ සසුන්ගත වුවන්ගේ ඒකායන අභිප්‍රාය වූයේ සියලු දුක් නැති කොට නිවන් අවබෝධ කරගැනීමයි. එකල භික්ෂූන් වහන්සේලාට විනය නීති පැනවීමේ අවශ්‍යතාවක් පැන නොනැගුණි. භික්ෂූන් වහන්සේලා බුදුරදුන් දේශිත ධර්මය සිය සංවරය සඳහා යොදා ගත්හ. මෙයට අමතරව එම යුගයේ භික්ෂූන්ගේ ස්වයං සංවරය පිණිස ඉවහල් වූ බුද්ධානුශාසනාවක් වූයේ,

1. උපෝසත කර්මයයි.
2. පාතිමොක්ඛුද්දේශයයි.
3. භික්ෂු ප්‍රාතිමෝක්ෂයයි.
4. උභය ප්‍රාතිමෝක්ෂයයි.
5. ඕවාද ප්‍රාතිමෝක්ෂයයි.

35. උපසම්පදා වූ භික්ෂුවකගේ වැදගත් සංඝ කර්මයක් ලෙස වස්සාවාස ක්‍රියාවලිය සැළකේ. ථෙරවාදී බෞද්ධ රටවල භික්ෂූහු බුද්ධ කාලයේ සිට අද දක්වා වස්විසීමේ චාරිත්‍රය පවත්වාගෙන එනු ලබයි. ඒ අනුව භික්ෂූන් වහන්සේලාගේ වස් විසීමේ චාරිත්‍රය ආරම්භ වනුයේ

1. බක්මස පුර පසලොස්වක පොහෝ දිනයේ සිට ය.
2. බක්මස පුර පසලොස්වක පොහෝ දින පොහොය කොට යෙදෙන අව පැලවිය දිනයේ සිට ය.
3. ඇසළ පුර පසලොස්වක පොහෝ දිනයේ සිට ය.
4. ඇසළ මස පුර පසලොස්වක පොහෝ දින පොහොය කොට යෙදෙන අව පැලවිය දිනයේ සිට ය.
5. නිකිණි පුර පසලොස්වක පොහෝ දිනයේ සිට ය.

36. සබ්බකාමී මහරහතන් වහන්සේට වජ්ජි පුත්තක භික්ෂූන්ගේ නොහිසි හැසිරීම් රටාව ගැන දැනගන්නට ලැබුණු පසු ඒ ගැන සෙවීමට යස හිමියන් විශාලා මහනුවරට යවන ලදී. එහිදී යස හිමියන්ට දස වස්තුව අතුරින් මුලින්ම දැන ගැනීමට ලැබුණේ,

1. ජාත රූප රජත කප්පයයි.
2. අදසක නිසීදන කප්පයයි.
3. සිංගිලෝණ කප්පයයි.
4. ගාමන්තර කප්පයයි.
5. ද්වංගුල කප්පයයි.

37. ටිබෙට් දේශයේ බුදු සමය ව්‍යාප්ත කළ දීපංකර ශ්‍රී ඥාන හිමියන්ගෙන් පසු නැවත එරට බුදු සමය සංවර්ධනය කිරීමට දායක වූ ශ්‍රී බද්ධ තෙරුන් හා ඔහුගේ ශිෂ්‍ය දාන සීල තෙරුන් අධ්‍යාපනය ලැබුවා වූත් මහායාන ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් ටිබෙට් බසට පරිවර්තනය කරනු ලැබූවා වූත් උතුරු බෙංගාලයේ පිහිටි ඉපැරණි විශ්ව විද්‍යාලය කුමක්ද?

1. වික්‍රමශිලා 2. ජගද්දලා 3. නාලන්දා 4. වලභි 5. තක්ෂිලා

38. "මම බුදුන් දහම් සඟුන් සරණ ගත වූයෙමි. ශාක්‍ය පුත්‍රයන්ගේ ශාසනයෙහි උපාසක බැව් ගිවිස්සෙමි. නරෝත්තමය තෙපිද ශ්‍රද්ධාවෙන් සිත පහදවාගෙන තෙරුවන් සරණ යව".මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දක්ද?

1. බිම්බිසාර රජු විසින් කොසොල් රජතුමාට
2. නිග්‍රෝධ හිමි විසින් අශෝක රජතුමාට
3. අශෝක රජු විසින් දේවානම් පියතිස්ස රජතුමාට
4. උපගුප්ත තෙරුන් විසින් අශෝක රජතුමාට
5. මහ විජයබාහු රජු විසින් අනුරුද්ධ රජතුමාට

39. ප්‍රාග් බෞද්ධ ලාංකේය ජන සමාජය තුළ විවිධ ආගම්, ඇදහිලි හා විශ්වාස පැවතුණි. ඇදහිලි අතර යක්ෂ, දේව, නාග, මළවුන් පිදීම, වෘක්ෂ වන්දනය ඉතා ප්‍රචලිත විය. ඒ අතර දෙවියන් ලෙස වන්දනාවට ලක් වූ පිරිස් තවත් වරෙක යක්ෂයින්ගේ අධිපතිත්වය දරූ අවස්ථාවන් පිළිබඳවද වාර්තාවේ. එසේ වන්දනයට ලක් වූ අයෙකි.

1. සුමන සමන් 2. කම්මාර 3. කාලවේල 4. වෛශ්‍රවන 5. ජුතින්දර

40. ලක්දිව බුදුසමය ස්ථාපිත වීමෙන් අනතුරුව මුලින්ම ආරම්භ වූ මහා විහාරයට අභියෝගාත්මකව ගොඩනැගුණු අභයගිරි විහාරය පසුකාලීනව ජනතාව අතර ප්‍රචලිත වීම උදෙසා ගත්තා වූ විවිධ ක්‍රියා මාර්ග අතර එක් ක්‍රියාමාර්ගයක් වුයේ,

1. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරිම යි.
2. අටුවා ග්‍රන්ථ සම්පාදනය යි.
3. ත්‍රිපිටකය මුඛ පරම්පරාගතව පවත්වා ගෙන යාම යි.
4. ථෙරවාදී බුදු දහමට පටහැනි මතවාද බැහැර කිරීම යි.
5. ජනප්‍රිය පුදපූජා උත්සව සංවිධානය කිරීම යි.

41. ලක්දිව රාජ්‍ය බලය ලබාගන්නා කෙනෙකු වේ නම් හෙතෙම බෞද්ධයෙකු වියයුතු බව ලාංකේය සංස්කෘතිය හා බැඳී පැවැතුණි. ඇතැම් රජවරු සෙල්ලිපි පවා පිහිටුවමින් මේ බව සනාථ කර ඇත. "සිරි ලක්හි නොබෝ සත්හු නොරජ්වන්හයි" යන සෙල් ලිපි පාඨය එයට එක් නිදසුනකි. මෙම සෙල්ලිපි පාඨය දැක්වෙන්නෙ,

1. නිශ්ශංක මල්ල රජුගේ පුවරු ලිපියේ ය.
2. හතරවන මිහිඳු රජුගේ පුවරු ලිපියේ ය.
3. රජගල සෙල් ලිපියේ ය.
4. ජේතවනාරාම පුවරු ලිපියේ ය.
5. තෝනිගල සෙල්ලිපියේ ය.

42. නිර්මල ථෙරවාදී බුදු දහම ක්‍රියාත්මක රටවල් අතර ථායිලන්තයට ද ප්‍රමුඛත්වයක් හිමිවේ. එරට භික්ෂු සංස්ථාවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලබන්නේ සංඝරාජයන් වහන්සේය. උන්වහන්සේට එරට රජතුමාට හා සමාන බලයක් හිමි වි ඇත. එබඳු බලයක් සහිත සංඝරාජයාණන් වහන්සේ පත්කරනු ලබන්නේ

1. ථායිලන්තයේ ජනතාව විසිනි.
2. ථායි භික්ෂූන් වහන්සේලා විසිනි.
3. සංඝ මන්ත්‍රී මණ්ඩලය විසිනි.
4. ථායිලන්තයේ රජතුමා විසිනි.
5. උත්තරීතර සංඝ සභාව විසිනි.

43. චීනයේ මාධ්‍යමික සම්ප්‍රදායේ ගුරුවරයා ලෙස සැලකෙනුයේ කුමාරජීව පඬිවරයා ය. එතුමාගේ සංස්කෘත හා චීන භාෂාව පිළිබඳ හසල දැනුම එරට බුදු දහමේ ව්‍යාප්තිය සඳහා මහගු පිටුවහලක් විය. එතුමන් විසින් විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කළ අතර ඇතැම් ඒවා චීන බසට පරිවර්තනය කොට ඇත. එසේ පරිවර්තනය කළ කෘතීන් අතර සුවිශේෂී කෘතියක් වන්නේ,

1. අභිධර්මකෝෂ ව්‍යාඛ්‍යා ශාස්ත්‍රයයි.
2. අෂ්ඨාදශ ශූන්‍යතා ශාස්ත්‍රයයි.
3. සද්ධර්ම පුන්ඩරීක සූත්‍රයයි.
4. සන්ධි නිර්මෝචන සූත්‍රයයි.
5. මහා රත්නකූට සූත්‍රයයි.

44. ස්තූප නිර්මාණකරණයේ ඉතිහාසය ප්‍රාග් බෞද්ධ යුගය දක්වා දිවයයි. මියගිය පුද්ගලයෙකුට ගෞරව කිරීම සඳහා නිර්මාණය වූ ස්තූපය පූජනීය සංකේතයක් බවට පත්වූයේ බෞද්ධ ස්තූප නිර්මාණයත් සමඟ ය. පැරණිම බෞද්ධ ස්තූපයට සාක්ෂි වශයෙන් දැක්විය හැකිවන්නේ

1. සාංචි ස්තූපයයි.
2. අමරාවති ස්තූපයයි.
3. නාගර්ජුණි කොන්ඩ ස්තූපයයි.
4. භාර්හුට් ස්තූපයයි.
5. ධම්මික ස්තූපයයි.

45. සඳකඩ පහණ හෙළ කලාකරුවාගේ කලා කෞශල්‍ය ප්‍රකට කෙරෙන සුවිශේෂී නිර්මාණයකි. විශේෂයෙන් එහි අන්තර්ගත කැටයම් මෙම නිර්මාණයේ සුවිශේෂත්වය ප්‍රකට කිරීමට සමත් වී ඇත. බොහෝ විද්වතුන්ගේ මතය වන්නේ මෙම කැටයම් තුළින් කිසියම් දාර්ශනික අදහසක් පිළිබිඹු කෙරෙන බවයි. මේ පිළිබඳව උගතුන් විවිධ මත පළකර ඇත. ඒ අනුව මහාචාර්ය විනී විතාරණ ශූරීන්ගේ මතය වන්නේ,

1. සංසාර චක්‍රය නිරූපනය වන බව ය.
2. පාරිශුද්ධත්වය නිරූපනය කෙරෙන බව ය.
3. සිව් දිසාවෙන් පැමිනෙන අයට විවෘත වූ ස්ථානයක් බව ය.
4. නිර්වාණය සංකේතවත් කෙරෙන බව ය.
5. සෞභාග්‍යය සංකේතවත් කෙරෙන බව ය.

46. බුද්ධ ප්‍රතිමාවන්හි ආරක්ෂාව සඳහාත් ප්‍රතිමා වන්දනාවෙහි යෙදෙන්නන්ගේ ආරක්ෂාව සඳහාත් ඉදිවූ ගෘහ නිර්මාණ විශේෂය ප්‍රතිමාඝර නමින් හැඳින්වේ. පැරණි ගෘහ නිර්මාණ ශිල්පීන් ඉදිකළ පටිමාඝර ප්‍රධාන වශයෙන් වර්ග තුනකට බෙදා වෙන් කෙරේ. ඒ ගන්ධ කුටි ක්‍රමය, පාසාද ක්‍රමය, ගෙඩිගේ ක්‍රමය වශයෙනි. මෙයින් ගන්ධ කුටි ක්‍රමයේ ඉපැරණි ප්‍රතිමා ගෘහයක් වන්නේ,

1. තිවංක පිළිම ගෙය යි.
2. කිරිබත් වෙහෙර පිළිම ගෙය යි.
3. ලංකාතිලක පිළිම ගෙය යි.
4. ගඩලාදෙණිය පිළිම ගෙය යි
5. ථූපාරාම පිළිම ගෙය යි.

47. උම්මග්ග ජාතකය, දළදා සිරිත, සිංහල බෝධි වංශය ආදී වශයෙන් වැදගත් සාහිත්‍ය කෘති ගණනාවක් රචනා වූ සාහිත්‍ය යුගය වන්නේ

1. අනුරාධපුර සාහිත්‍ය යුගයේ ය.
2. පොළොන්නරු සාහිත්‍ය යුගයේ ය.
3. දඹදෙණි සාහිත්‍ය යුගයේ ය.
4. කුරුණෑගල සාහිත්‍ය යුගයේ ය.
5. කෝට්ටේ සාහිත්‍ය යුගයේ ය.

48. කලාකෙත පෝෂණය කිරීමට දායක වූ අපේ නිර්මාණකරුවන් බුද්ධ චරිතය මෙන් ම ජාතක කතාවන්ද පදනම් කරගෙන ස්වකීය නිර්මාණ කිරීමට පෙළඹුණි. විසි වන සියවසේ බිහි වූ මහා නාට්‍ය වේදියාණන් ලෙස සැලකෙන මහාචාර්ය සරච්චන්ද්‍රයන් තම නාට්‍ය නිර්මාණයන් සඳහා ජාතක කතා යොදාගෙන ඇත. එතුමන් විසින් උද්දාල ජාතකය මුල්කරගෙන නිෂ්පාදනය කළ නාට්‍ය වූයේ,

1. බවකඩතුරාව ය.
2. ලෝමහංස ය.
3. පේමතෝ ජායතී සෝකෝ ය.
4. කදාවළලු ය.
5. මනමේ ය.

49. කණිෂ්ක රාජ්‍ය සමය වනවිට සංඝ සමාජය විවිධ නිකායවලට බෙදී ඒ ඒ නිකාය විසින් අනුදත් පිළිවෙළට බුදු දහම විවරණය කරනු ලැබිණි. මේ විවිධත්වය ඉවත්කොට බුදු දහම පෙර පැවැති තත්වයට පත්කිරීමට කටයුතු කරන ලෙසට රජු උපදෙස් දෙනු ලැබුවේ,

1. පාර්ශව තෙරුන්ට ය.
2. වසුමිත්‍ර තෙරුන්ට ය.
3. වසු බන්ධු තෙරුන්ට ය.
4. මහාදේව තෙරුන්ට ය.
5. ඇමතියෙකුට ය.

50. පළමු ධර්ම සංගායනාවේදී විනය පිටකය පවත්වාගෙන යාමේ වගකීම උපාලි මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පිරිසට භාරවිය. සූත්‍ර පිටකයට අයත් ධර්ම කොටස් ද එලෙස ම ඉදිරියට පවත්වාගෙන යාමේ වගකිම භාණක පිරිස් වෙත පැවරුණි. එම භාණක පිරිස් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

1. දීඝ නිකාය - සැරියුත් මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පිරිස
2. මජ්ඣිම නිකාය - ආනන්ද මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පිරිස
3. සංයුක්ත නිකාය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පිරිස
4. අංගුත්තර නිකාය - සෙසු භික්ෂූන් වහන්සේලා ප්‍රධාන ශිෂ්‍ය පිරිස
5. බුද්ධක නිකාය - අනුරුද්ධ මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පිරිස